සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018
# භූගෝල විද්‍යාව - I

11 ශ්‍රේණිය | කාලය පැය 03 යි.

නම/ විභාග අංකයඃ

උපදෙස් :
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

---

- **ප්‍රශ්න අංක 01 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01 පෘථිවි පද්ධතිය, උප පද්ධති ............................................... සමන්විත වේ. ( තුනකින්, හතරකින්, පහකින් )

02 නිර්මාණය වී ඇති ආකාරය අනුව වර්ගකල විට හිමාලය, ඇල්ප් වැනි කඳු අයත් වන්නේ ...................................................... ගණයටය. (කුට්ටි කඳු, ශේෂ කඳු, නැමි කඳු)

03 භූ තැටි චලනය වන්නේ ප්‍රාවරණය තුළ ක්‍රියාත්මකවන ........................................................... වල බලපෑම නිසාය. (භූමිකම්පා, සංවහනධාරා, සම්පීඩන බලවේග)

04 ආසියා මහද්වීපයේ පිහිටි විශාලම මිරිදිය විල ලෙස සැලකෙන්නේ ...................................................... විලයි. (බයිකල් / බෝල්කෑෂ් / ඇන්ගරා)

05 පුත්තලමේ සිට මුලතිව් දක්වා වෙරළබඩ ප්‍රදේශවල .................................... අවධියට අයත් හුණුගල් පාෂාණ දක්නට ඇත. (ජුරාසික, මයෝසීන, ප්ලයිටොසීන)

06 ලෝකයේ දේශගුණ ව්‍යාප්තිය පිළිබඳව මුල්ම අදහසක් ඉදිරිපත් කරනු ලැබුවේ ක්‍රි. පූ 354 දී පමණ ජීවත් වූ ග්‍රීක ජාතික ........................................................ විසිනි. (ටොලමි, මිලර්, ඇරිස්ටෝටල්)

07 ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපීය දිස්ත්‍රික්කවල ව්‍යාප්තව ඇති ප්‍රධාන පාංශු වර්ගය ............................................................ වේ. (රතු කහ පොඩ්සොලික් පස, දියළු පස, රතු දුඹුරු පස)

08 2001 වසරේදී ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද මයික්‍රො මෝටර් රථ එකළස් කිරීමේ කර්මාන්තය ........................................................... ප්‍රදේශයේ පිහිටුවා ඇත. (මීගමුව, පොල්ගහවෙල, වීරවිල)

09 නිෂ්පාදනයට වැය කරන මුදල මෙන් දෙගුණයක් පර්යේෂණ කටයුතු සඳහා වැය කිරීම ................................................................ කර්මාන්තයේ විශේෂ ලක්ෂණයකි. (එකලස් කිරීමේ, විද්‍යුත්, මෝටර් රථ)

10 ශ්‍රී ලංකාව 1:50000 පරිමාණයට අනුව සකස්කරන ලද සිතියම් කොටස් 92 කින් සමන්විත වන අතර එවැනි එක් සිතියම් කොටසකට අයත් භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් ........................................................ කි. (1000, 10000, 50000)

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් ''නි'' යන්න වටා ද, වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.**

11 මිනිරන් ලෝහමය ඛනිජ ගණනට අයත් වේ. ( නි / වැ )

12 සෞම්‍ය කලාපීය ප්‍රදේශවල ඇති වෙනත් වගාවක් සඳහා යොදා ගත නොහැකි ආන්තික බිම් කිරිපට්ටි පාලනය සඳහා යොදා ගනී. ( නි / වැ )

13 දකුණු හා අග්නිදිග ආසියා රටවලත් අප්‍රිකානු රටවලත් වතු වගාවක් ලෙස ව්‍යාප්ත වූ රබර් බ්‍රසීලයේ කැලෑබඳ ප්‍රදේශවලින් සොයා ගන්නා ලද්දකි. ( නි / වැ )

14 ජන සංඛ්‍යා ස්පෝටණයේ ප්‍රතිඵලයක් ලෙස ජන හායනය පෙන්වා දිය හැකිය. ( නි / වැ )

15 පාංශු ස්ථරය මත ඇති ශාක හා සත්ව කොටස් දිරාපත්වීමෙන් පසට එකතුවන ඓන්ද්‍රීය ද්‍රව්‍ය හ්‍යුමස් නම් වේ. ( නි / වැ )

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවල ''අ'' සහ ''ආ'' යනුවෙන් තීර දෙකක් දැක්වේ. ඒවා සම්බන්ධතාව අනුව ගැලපූ විට නිවැරදි පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියා දක්වන්න.**

16 පෘථිවි පෘෂ්ඨය සෑදී ඇති ප්‍රධාන පාෂාණ වර්ග 'අ' තීරුවේ ද, ඒවාට අයත් ද්විතියික පාෂාණ 'ආ' තීරුවේ ද දැක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙලට 'ආ' තීරුව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| ''අ'' | | ''ආ'' | |
|---|---|---|---|
| 1. | ආග්නේය පාෂාණ | A | හුණුගල්, ගල් අඟුරු |
| 2. | අවසාදිත පාෂාණ | B | කිරිගරුඬ, ඩොලමයිට් |
| 3. | විපරිත පාෂාණ | C | ග්‍රැනයිට්, බැසොල්ට් |
| | | D | නයිස්, ජිප්සම් |

(1) BAD (2) CAB (3) CDA (4) ABD (.........)

17 ගංගාවක ආරම්භය විවිධ වන අතර එසේ ආරම්භ වී ගලන ගංගා කීපයක් 'අ' තීරුවේ ද, ඒවා ආරම්භ වන ස්ථාන 'ආ' තීරුවේ ද දැක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙලට 'ආ' තීරුව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| ''අ'' | | ''ආ'' | |
|---|---|---|---|
| 1. | තේම්ස් | A | විලකින් |
| 2. | නයිල් | B | කඳුකර ප්‍රදේශකයකින් |
| 3. | රයින් | C | උල්පතකින් |
| | | D | ග්ලැසියර් දිය වූ ජලයෙන් |

(1) ACD (2) ABC (3) CAD (4) CDA (.........)

18 ලෝකයේ සිදුවන ස්වභාවික උපද්‍රව වර්ග 'අ' තීරුවේ ද, ඒවාට අයත් නිදසුන් 'ආ' තීරුවේ ද දැක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙලට 'ආ' තීරුව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| ''අ'' | | ''ආ'' | |
|---|---|---|---|
| 1. | භූ විද්‍යාත්මක උපද්‍රව | A | නායයෑම්, සතුන් වඳවීම. |
| 2. | දේශගුණ උපද්‍රව | B | සුළි සුළං, නියඟ |
| 3. | ජීව විද්‍යාත්මක උපද්‍රව | C | ලැව්ගිනි, වසංගත |
| | | D | භූමිකම්පා, ගිණිකඳු |

(1) DBC (2) ACB (3) BCA (4) CDA (.........)

19 ශ්‍රී ලංකාවේ ඇති සුළු අපනයන බෝග කීපයක් 'අ' තීරුවේ ද, ඒවා බහුල වශයෙන් වගා කරන ප්‍රදේශ කීපයක් 'ආ' තීරුවේ ද දැක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙලට 'ආ' තීරුව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| ''අ'' | | ''ආ'' | |
|---|---|---|---|
| 1. | ගම්මිරිස් | A | බදුල්ල, බණ්ඩාරවෙල |
| 2. | සාදික්කා | B | පුත්තලම, මන්නාරම |
| 3. | කජු | C | මාතලේ, කෑගල්ල |
| | | D | මහනුවර, රත්නපුර |

(1) ACD (2) CDB (3) BAD (4) CBD (.........)

20 බලශක්ති උත්පාදන කීපයක් 'අ' තීරුවේ ද, ඒවා හා සම්බන්ධ විදුලිබලාගාර 'ආ' තීරුවේ ද දැක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙලට 'ආ' තීරුව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| ''අ'' | | ''ආ'' | |
|---|---|---|---|
| 1. | සූර්ය ශක්තිය | A | බරුතකන්ද |
| 2. | සුළං | B | කෙරවලපිටිය |
| 3. | ජල විදුලිය | C | හම්බන්තොට |
| | | D | කොත්මලේ |

(1) ABC (2) CAB (3) DCA (4) ACD (.........)

- **ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් දී ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.**

21 ශ්‍රී ලංකාවේ පෙට්‍රෝලියම් පිරිපහදු කිරීමේ කර්මාන්තශාලාව කැලණියට ආසන්න ........................................ ප්‍රදේශයේ පිහිටුවා ඇත.


22 උතුරු ඇමරිකාවේ පිහිටි මිසිසිපි හා ........................................................ නිම්නය ආසියාවෙන් පිටත වී වගා කරන ප්‍රදේශයකි.

23 මහාද්වීප මායිමේ සිට සාගරය දෙසට පැතිරී ගිය නොගැඹුරු මුහුදු තීරය ........................................................ ලෙස හැඳින්වේ.

24 ලෝකයේ සක්‍රීය ගිනිකඳුවලින් 70% ක් ම පිහිටා ඇත්තේ ........................................................ සාගරය අවට කලාපයේ ය.

25 භූමි කම්පාවල තීව්‍රතාව මැනීම සඳහා ........................................................ පරිමාණය භාවිත කෙරේ.

- **අංක 26 සිට 28 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති රූප සටහන උපකාර කර ගන්න. නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.**




26 රූප සටහනෙහි AB රේඛාවෙන් දැක්වෙන්නේ ........................................................................................ කි.


27 රූප සටහනෙහි CD රේඛාවෙන් දැක්වෙන්නේ ........................................................................................ කි.

28 රූප සටහනෙහි EF රේඛාවෙන් දැක්වෙන භූ ලක්ෂණය වන්නේ ................................................................ කි.

- **අංක 29 සිට 31 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ප්‍රස්ථාර සටහන උපයෝගී කර ගන්න. නිවැරදි පිළිතුරෙහි අංකය වරහන තුළ යොදන්න.**

29 පහත ප්‍රස්තාර සටහනේ ඇති වැඩිම අපනයන සංයුතියක් දක්වන බෝගය කුමක්ද?

(1) තේ (2) පොල්
(3) රබර් (4) අනෙකුත් බෝග (.........)




30 මෙම ප්‍රස්තාර වර්ගය හඳුන්වන නම කුමක්ද?

(1) සරල තීරු ප්‍රස්තාර
(2) බෙදූ වෘත්ත ප්‍රස්තාර
(3) සමානුපාතික වෘත්ත ප්‍රස්තාර
(4) ද්විත්ව තීරු ප්‍රස්තාර (.........)

31 පහත දැක්වෙන විචල්‍ය අතුරින් ඉහත ප්‍රස්තාර වර්ගය භාවිතා කර, නිරූපනය කල හැකි විචල්‍ය සඳහන්වන පිළිතුර කුමක්ද?

(1) ජන සංඛ්‍යාවේ වර්ධනය (2) බෝග වර්ග දෙකක අස්වැන්න.
(3) උපත් හා මරණ අනුපාතය (4) රටක ජන සංයුතිය (.........)

- **ප්‍රශ්න අංක 32 සිට 38 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

32 ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත උසස් තත්ත්වයේ තේ මිලදී ගන්නා ප්‍රධාන කලාපය වන්නේ,

(1) දකුණු ආසියාව (2) මැදපෙරදිග කලාපය
(3) යුරෝපා කලාපය (4) ලතින් ඇමරිකානු කලාපය (.........)

33 ගැඹුරු සාගරයේ යමහල් ක්‍රියාකාරීත්වය මගින් ඇති වූ දූපතකට නිදසුනකි.

(1) නිකොබාර් (2) සිසිලිය (3) හවායි (4) තස්මේනියාව (.........)

34 'කඩොල්, කිරළ, ගිංපොල් ආදී ශාක බහුලව දැකිය හැකි වනාන්තර වර්ගය කුමක්ද?

(1) කඩොලාන (2) කටු පඳුරු
(3) ලඳු කැලෑ (4) අතරමැදි වනාන්තර (.........)

35 කර්මාන්ත ස්ථානගත වීමට බලපාන සාධක අතුරින් යටිතල පහසුකම් යටතට අයත් නොවන්නේ කුමන සාධකයද?

(1) බැංකු (2) වෙළඳපොළ (3) රක්ෂණ (4) සන්නිවේදනය (.........)

36
- 1900 mm - 5400 mm දක්වා වූ වර්ෂාපතනය
- 15°C - 27°C දක්වා සාමාන්‍ය උෂ්ණත්වය
- ලෝම් ලැටරයිට් පස
- ජලය බැසයන මද බෑවුම් සහිත ප්‍රදේශ

ඉහත සඳහන් භෞතික සාධක වැදගත් වන්නේ පහත සඳහන් ඒවා අතුරින් කිනම් වගාවක් සඳහා ද?

(1) පොල් (2) රබර් (3) තේ (4) තිරිඟු (.........)

37 වර්තමානයේදී ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම කෙරෙහි බලපාන ප්‍රධාන වායුවක් වන්නේ,

(1) නයිට්‍රජන් (2) ඔක්සිජන්
(3) ආගන් (4) කාබන්ඩයොක්සයිඩ් (.........)

38 ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ගෘහ කර්මාන්ත කිහිපයක් 'අ' තීරුවේද, ඒවාට ප්‍රසිද්ධ ප්‍රදේශ 'ආ' තීරුවේද දැක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙලට 'ආ' තීරුව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| 1. පිත්තල කැටයම් | A මොරටුව |
| 2. වෙස් මුහුණු | B ගාල්ල |
| 3. බීරළු හා රේන්ද | C අම්බලන්ගොඩ |
| | D පිළිමතලාව |

(1) ACB (2) DAB (3) DCB (4) CBD (.........)

- **අංක 39 සහ 40 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන තොරතුරු උපයෝගී කරගන්න.**

A වර්ෂාපතනය
B ගෝලීය උෂ්ණත්වය
C ජල ගැලීම්
D පොසිල ඉන්ධන දහනය
E නියගය

39 එක් සාධකයක අඩුවීම වෙනත් සාධකයක වැඩිවීම කෙරෙහි බලපෑමක් අති කරන බවට දැක්වෙන ප්‍රකාශ අඩංගු අක්ෂර දෙක ඇතුලත් පිළිතුර වනුයේ,

(1) A හා E (2) B හා D (3) B හා E (4) D හා C (.........)

40 එක් සාධකයක වැඩිවීම තවත් සාධකයක වැඩිවීම කෙරෙහි බලපෑමක් ඇති කරන බවට දැක්වෙන ප්‍රකාශ අඩංගු අක්ෂර දෙක ඇතුලත් පිළිතුර වනුයේ,

(1) C හා A (2) D හා B (3) D හා C (4) D හා E (.........)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය**

# භූගෝල විද්‍යාව - II

නම/ විභාග අංකයඃ

- මෙම ප්‍රශ්න පත්‍රය **I, II** වශයෙන් කොටස් දෙකකි. **I** ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි අ, ආ, ඉ කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුයි. **II** කොටසින් ප්‍රශ්න හතර (04) කට පමණක් පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05 කි.

## I - කොටස

(01) (අ) ඔබ වෙත සපයා ඇති 1:50000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කොට ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (පිටු අංක 5) යොදා ගන්න.

අංක (i) සිට (vi) දක්වා ඇති ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) අංක 01 න් දැක්වෙන භූ ලක්ෂණය කුමක්ද? (වැලිතලාව, ගල, රක්ෂිත වනාන්තර) (ල. 01)

(ii) අංක 02 න් දැක්වෙන මාර්ගය (පුළුල් ඒකීය මාර්ගයයි, පුළුල් ද්විතියික මාර්ගයයි, අඩිපාරකි) (ල. 01)

(iii) අංක 03 න් දැක්වෙන පරිපාලන මායිම කුමක්ද? (උප දිසාපති කොට්ඨාශ මායිම, දිස්ත්‍රික්ක මායිම, ග්‍රාමසේවා නිළධාරී කොට්ඨාස මායිම) (ල. 01)

(iv) අංක 04 න් දැක්වෙන මාර්ග හා සම්බන්ධ වන ලක්ෂණ කුමක්ද? (පාලම, දිය මංකඩ, බෝක්කුව) (ල. 01)

(v) අංක 05 ක් දැක්වෙන වෘක්ෂලතා වර්ගය කුමක්ද? (ළඳුකැලෑ, වගුරුබිම්, වනාන්තර) (ල. 01)

(vi) අංක 06 න් දැක්වෙන වාරිමාර්ග ලක්ෂණය කුමක්ද? (අත්හරින ලද වැව, වැව, ජලාශය) (ල. 01)

(vii) අංක 07 න් දැක්වෙන ජනාවාස රටාව නම් කරන්න. (ල. 01)

(viii) අංක 08 න් දැක්වෙන වගාව කුමක්ද? (ල. 01)

(ix) බෞද්ධ හැර ගල්ගමුව නගරය තුළ වාසය කරන වෙනත් ආගමික ජන කොට්ඨාශයක් නම් කරන්න. (ල. 01)

(x) උතුරු දකුණු දිශානුගතව වැටී ඇති මාර්ගයේ දිග ගණනය කර කිලෝමීටර වලින් දක්වන්න. (ල. 01)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව දක්වා ඇති තීරුව (පිටු අංක 6) යොදාගන්න.

(i) A, B, C යන අක්ෂර අතුරින් යුරල් කඳු වැටිය දැක්වෙන අක්ෂරය කුමක්ද?

(ii) D, E, F යන අක්ෂර අතුරින් ප්‍රේරිස් තෘණ භූමිය දැක්වෙන අක්ෂරය කුමක්ද?

(iii) G, H, J යන අක්ෂර අතුරින් මරේඩාලිං ගංගාව දැක්වෙන අක්ෂරය කුමක්ද?

(iv) K, L, M යන අක්ෂර අතුරින් කළු මුහුද දැක්වෙන අක්ෂරය කුමක්ද?

(v) P, Q, R යන අක්ෂර අතුරින් ටෝකියෝ නගරය දැක්වෙන අක්ෂරය කුමක්ද? (ල. 05)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව දක්වා ඇති තීරුව (පිටු අංක 6) යොදාගන්න.

(i) A, B හා C යන අක්ෂර අතුරින් කන්නෙලිය වන රක්ෂිතය දැක්වෙන අක්ෂරය කුමක්ද?

(ii) D, E හා F යන අක්ෂර අතුරින් සුළු අපනයන බෝග පර්යේෂණ ආයතනය පිහිටි මාතලේ දැක්වෙන අක්ෂරය කුමක්ද?


(iii) G, H හා J යන අක්ෂර අතුරින් තාප විදුලි බලාගාරයක් වන නොරොච්චෝලේ දැක්වෙන අක්ෂරය කුමක්ද?

(iv) K, L හා M යන අක්ෂර අතුරින් මිරිස්ස ධීවර වරාය පිහිටි ස්ථානය දැක්වෙන අක්ෂරය කුමක්ද?

(v) P, Q හා R යන අක්ෂර අතුරින් කෙබලින් මැටි නිෂ්පාදනයට ප්‍රසිද්ධ බොරලැස්ගමුව දැක්වෙන අක්ෂරය කුමක්ද? (ල. 05)

## II - කොටස

(02) පෘථිවි ව්‍යුහයේ ප්‍රධාන ස්ථර දැක්වෙන රූප සටහනක් පහත දැක්වේ.




(i) ඉහත රූප සටහනට අනුව A හා B ස්ථර දෙක පිළිවෙලින් නම් කරන්න. (ල. 02)


(ii) අ) A හා B ස්ථර දෙක වෙන් කරන සීමාව හඳුන්වන නම ලියන්න. (ල. 01)

ආ) A ස්ථරය සමන්විත වන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ල. 02)

(iii) අ) C හා D ස්ථර වල විශේෂ ලක්ෂණය බැගින් ලියන්න. (ල. 02)

ආ) ශිලාගෝලයේ ඇති සම්පත් මිනිසා විසින් ප්‍රයෝජනයට ගැනීමේදී ශිලාගෝලයට ඇතිවන බලපෑම් 2 ක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)


(03) පෘථිවි වායුගෝලයේ දළ රූප සටහනක් පහත දැක්වේ.




(i) රූප සටහනේ B හා C වලින් දැක්වෙන ස්ථර දෙක නම් කරන්න. (ල. 02)


(ii) A ස්ථරයේ විශේෂ ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)

(iii) අ) ජල චක්‍රයේ ක්‍රියාකාරීත්වය දැක්වෙන පහත රූප සටහනේ A හා B වලින් දැක්වෙන ක්‍රියාවලි දෙක පිළිවෙලින් නම් කරන්න. (ල. 02)




ආ) ජලයේ ගුණාත්මක බව අඩුවීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

- **ප්‍රශ්න අංක 04 සහ 05 සඳහා පිළිතුරු සැපයීමේදී පහත දැක්වෙන ලෝක සිතියම ප්‍රයෝජනයට ගන්න.**




(04) (i) සිතියමට අනුව A හා B අක්ෂරවලින් දැක්වෙන වනාන්තර දෙක නම් කරන්න. (ල. 02)

(ii) ඔබ ඉහත නම් කල වනාන්තරවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ල. 03)

(iii) අ) ශ්‍රී ලංකාවේ ඇති වනජීවී රක්ෂිත අතුරින් දැඩි ස්වභාවික රක්ෂිතයක් හා ස්වභාවික රක්ෂිතයක් පිළිවෙලින් නම් කරන්න. (ල. 02)

ආ) වර්තමාන ශ්‍රී ලංකාවේ වන ජීවීන් හා වනාන්තර මුහුණපාන ගැටළු දෙකක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

(05) (i) ලෝකයේ ප්‍රධාන වශයෙන් වී වගා කරන

a) ආසියාතික රටක් වන මියන්මාරය සහ

b) යුරෝපීය රටක් වන ඉතාලියේ පෝ ගංගා නිම්නය දැක්වෙන අක්ෂර පිළිවෙලින් ලියන්න. (ල. 02)

(ii) ලෝකයේ ප්‍රධාන යැපුම් කෘෂිකර්මාන්තයක් වූ වී වගාවේ විශේෂ ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)

(iii) අ) වර්තමාන ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය ආශ්‍රිත ගැටළු දෙකක් සඳහන් කරන්න. (ල. 02)

ආ) ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ කෘෂි කර්මයේ ඇති වැදගත්කම කරුණු 2 කින් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

(06) (i) ලෝකයේ ද්විතියික ජන සංකේන්ද්‍ර 02 ක් ලියා දක්වන්න. (ල. 02)

(ii) ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තිය කෙරෙහි බලපාන

a) මානුෂ සාධකයක් සහ

b) භෞතික සාධක දෙකක් සඳහන් කරන්න. (ල. 03)

(iii) අ) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධනයේ හඳුනාගත හැකි කැපී පෙනෙන අවධි දෙක ලියන්න. (ල. 02)

ආ) ශ්‍රී ලංකා ජන සංඛ්‍යා වර්ධන අනුපාතයේ පහළ බැසීමට බලපා ඇති හේතු 3 ක් සඳහන් කරන්න. (ල. 03)


(07) (i) සංවර්ධනය මැනීම සඳහා යොදා ගන්නා පැරණි මිණුම් හා නූතන මිනුම් එක බැගින් දක්වන්න. (ල. 02)

(ii) ශ්‍රී ලංකාවේ මානව සම්පත් සංවර්ධනය සඳහා ගෙනඇති ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න. (ල. 03)

(iii) අ) ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් දියුණු කිරීමෙන් ලබාගත හැකි වාසි දෙකක් සඳහන් කරන්න. (ල. 02)

ආ) අන්තර්ජාල සම්බන්ධතාවලින් ලබාගත හැකි වාසි දෙකක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

(08) (i) ශ්‍රී ලංකාවේ බහුලවම ජල ගැලීම් වලට ලක්වන ගංගා නිම්න කිහිපයක් සිතියමේ දැක්වේ. B හා C අක්ෂර වලින් දැක්වෙන ගංගා නිම්න දෙක පිළිවෙලින් නම් කරන්න. (ල. 02)





(ii) ජල ගැලීම් ආපදාවට බලපාන,

a) ස්වභාවික හේතු එකක් සහ


b) මානුෂ ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න. (ල. 03)

(iii) අ) පහත ආපදා කළමනාකරණය චක්‍රයේ A හා B අවස්ථා දෙක නම් කරන්න.(ල. 02)

ආ) ඔබ නම් කළ A අවස්ථාවේදී කටයුතු කරන ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 03)



01 (ආ)




(i)

(ii)


(iii)

(iv)

(v)

/5

01 (ඉ)




(i)

(ii)

(iii)

(iv)

(v)

/5

01 (අ) /10 + (ආ) /5 + (ඉ) /5 = /20

භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II

ශ්‍රේණිය/Grade : ......................

විභාග අංකය
சுட்டெண்
Index Number ......................................................

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි.
பரீட்சகரின் உபயோகத் துக்கு மட்டும்
For Examiner's Use Only

(01) (අ)

(i) ............................................................................................

(ii) ............................................................................................

(iii) ............................................................................................

(iv) ............................................................................................

(v) ............................................................................................

(vi) ............................................................................................

............................................................................................

(vii) (a) ............................................................................................

(b) ............................................................................................

(c) ............................................................................................

10

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | හතරකින් | 11 | වැ | 21 | සපුගස්කන්ද | 31 | රටක ජන සංයුතිය |
| 02 | නැමිකඳු | 12 | නි | 22 | සැක්‍රමැන්ටෝ | 32 | (2) |
| 03 | සංවහනධාරා | 13 | නි | 23 | මහාද්වීපික තටකය | 33 | (3) |
| 04 | බයිකල් | 14 | වැ | 24 | පැසිපික් | 34 | (1) |
| 05 | මයෝසීන | 15 | නි | 25 | රිච්ටර් | 35 | (2) |
| 06 | ඇරිස්ටෝටල් | 16 | (2) | 26 | අවතල බෑවුම | 36 | (3) |
| 07 | රතු කහ පොඩ්සොලික් | 17 | (3) | 27 | කපොල්ල | 37 | (4) |
| 08 | පොල්ගහවෙල | 18 | (1) | 28 | කොත් කන්ද | 38 | (3) |
| 09 | විද්‍යුත් | 19 | (2) | 29 | තේ | 39 | (1) |
| 10 | 1000 | 20 | (4) | 30 | බෙදූ වෘත්ත ප්‍රස්තාර | 40 | (2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්) (ලකුණු 40)

## II පත්‍රය

### I - කොටස

(01) (අ) (i) ගල (ii) පුළුල් ඒකීය මාර්ගයකි (iii) උපදිසාපති කොට්ඨාස මායිම

(iv) බෝක්කුව (v) ළඳුකැළෑ (vi) වැව (vii) රේඛීය ජනාවාස (viii) වෙනත් වැව්ලි

(ix) මුස්ලිම්, ක්‍රිස්තියානි, හින්දු (x) 10-10.5km

(ආ) (i) B (ii) F (iii) J (iv) L (v) P

(ඉ) (i) C (ii) D (iii) J (iv) L (v) R

(02) (i) A - කබොල B - ප්‍රාවරණය (ල. 02)

(ii) අ) මොහොරොවිසික් අසන්තිය (ල. 01)

ආ) සියල් ස්තරය / සීමා ස්තරය (ල. 02)

(iii) අ) C - ද්‍රවමය ලෝහවලින් සමන්විතයි (නිකල් හා යපස් අඩංගුයි.)

D - ඝනලෝහ සංයුතියක් සහිතයි (යකඩ අඩංගු වේ.) (ල. 02)

ආ) ♦ ඛනිජ ලබා ගැනීමේදී සිදුවන භූමි හායනය ♦ වනාන්තර එළිකිරීමෙන් භූමිය නිරාවරණය වී පාංශු ඛාදනය ♦ මතුපිට භූ දර්ශනය වෙනස් වීම. ♦ කර්මාන්ත ශාලා හා ගෘහස්ථව සිදුකරන අපද්‍රව්‍ය බැහැර කිරීම මගින් ශිලාගෝලයේ ඇතැම් ස්තරවලට හානි සිදුවීම, භූගත ජල මට්ටම වෙනස් වීම වැනි බලපෑම් 2 ක් දක්වා එකක් විස්තර කිරීමට (ල. 03)

(03) (i) B - අපරවර්ති ගෝලය C - මෙසෝගෝලය (ල. 02)

(ii) ♦ පෘථිවි තලයේ සිට 8-12 km පමණ දක්වා ඉහලට විහිදේ. ♦ උන්නතාංශය සමඟ උෂ්ණත්වය පහළ බසී. ♦ වර්ෂාව, උෂ්ණත්වය, පීඩනය, සුළං, ආර්ද්‍රතාව, වලාකුළු වර්ධනය වැනි කාලගුණික සංසිද්ධි ක්‍රියාත්මක වේ. (ල. 03)

(iii) අ) A - උත්ස්වේදනය B - වාෂ්පීකරණය (ල. 02)

ආ) ♦ කර්මාන්ත සඳහා යොදා ගන්නා ජලය, අපවිත්‍ර ජලය ලෙස පිට කිරීමේදී විවිධ රසායනික හා කාබනික ද්‍රව්‍ය ජලයට එකතු වීම. ♦ කෘෂි කර්මාන්තයේදී පසට එකතු කරන පොහොර වර්ග කෘෂි රසායන ද්‍රව්‍ය ජලය සමඟ මිශ්‍ර වීම. ♦ මල ද්‍රව්‍ය අපවහනය නිසා මතුපිට ජලාශ සහ භූගත ජලයට අපද්‍රව්‍ය එකතු වීම වැනි කරුණු දෙකක් දක්වා එකක් පැහැදිලි කිරීමට (ල. 03)

(04) (i) A - ඇමේසන් වනාන්තර B - කොන්ගෝ වනාන්තර (ල. 02)

(ii) ♦ ජෛව විවිධත්වය ඉහළයි. ♦ පැළෑටි වර්ධනය වේගයෙන් සිදු වේ. ♦ ශාක පත්‍ර පලල් ය. / පත්‍ර බහුලයි. ♦ වැල් වර්ග යටි රෝපණය බහුලයි. ♦ අපිශාක බහුලයි. ♦ වනාන්තර ස්ථර කිහිපයකින් යුක්ත වේ. (ල. 03)

(iii) අ) දැඩි ස්වභාවික රක්ෂිත - හක්ගල, යාල, රිටිගල

ස්වභාවික රක්ෂිත - ත්‍රිකෝණ මඩු, මින්නේරිය, ගිරිතලේ, වැටහිරියා කන්ද (ල. 02)

ආ) ♦ වැඩිවන ජන සංඛ්‍යාව සමඟ විවිධ අවශ්‍යතා සඳහා වනාන්තර එළි කිරීම. ♦ පරිසර දූෂණ මගින් ශාක හා සත්ව විශේෂ වඳ වී යාම. ♦ ආක්‍රමණශීලී ශාක හා සත්ව විශේෂ බෝ වීම. ♦ මාර්ග තැනීම, සංවර්ධන ව්‍යාපෘති වැනි කටයුතු සඳහා වනාන්තර ප්‍රදේශ යොදා ගැනීම. ♦ වාණිජමය අරමුණු සඳහා සත්ත්ව හා ශාක විශේෂ එකතු කිරීම නිසා ඒවා වඳ වීම. (ල. 03)

(05) (i) a) මියන්මාරය - G b) ඉතාලිය පෝ ගංගා නිම්නය C (ල. 02)

(ii) ♦ කුඩා ගොවිබිම්වල වී වගා කිරීම. ♦ ඇතැම් රටවල ව්‍යාපාරික මට්ටමින් විශාල ගොවිබිම් වල වගා කිරීම. ♦ ශ්‍රම සූක්ෂම වගාවක් වීම. ♦ ඓන්ද්‍රීය පොහොර කෙරෙහි අවධානය යොමු වීම. ♦ විශේෂ ගුණාංග වලින් යුත් සහල් වර්ග නිපදවීම. ♦ ජාන තාක්ෂණය උපයෝගී කර ගැනීම. (ල. 03)

(iii) (අ) ♦ ඉඩම් හිඟය, ඉඩම් කැබලිවල අස්වැන්න අඩුවීම. ♦ යන්ත්‍ර සූත්‍ර භාවිතය අඩුවීම. ♦ යෙදවුම් මිල ඉහළ යාම. ♦ පුහුණු ශ්‍රමය තරුණ පිරිස අකමැති වීම ආදී.. (ල. 02)

ආ) ♦ දළ දේශීය නිෂ්පාදනයට දක්වන දායකත්වය. ♦ ශ්‍රම බලකායෙන් වැඩි පිරිසක් කෘෂි අංශයේ රැකියාවල නියුක්ත වීම (රැකියා වියුක්තියට පිළියමක් වීම.) ♦ ආහාර නිෂ්පාදනයට ♦ කර්මාන්තවලට අමුද්‍රව්‍ය සැපයීම දක්වා එකක් පැහැදිලි කළ යුතුයි. (ල. 03)

(06) (i) ♦ උතුර ඇමරිකාවේ නැගෙනහිර බටහිර හා ඊසාන දිග වෙරළබඩ කලාපයේ සංකේන්ද්‍රණය ♦ දකුණු ඇමරිකාවේ නැගෙනහිර වෙරළ බඩ කලාපයේ සංකේන්ද්‍රණ ♦ නයිල් ගංගා මෝය ආශ්‍රිත කලාපය ♦ බටහිර අප්‍රිකාවේ සියරාලියෝන්, ලයිබීරියාව, අයිවරිකෝස්ට්, ගානාව යන රටවල් ආශ්‍රිත කලාපය (ල. 02)

(ii) a) යටිතල පහසුකම්, වෙළඳපොළ, නාගරිකරණ, කාර්මිකරණය.

b) භූ විෂමතාවය, දේශගුණ පස, ජලය (ල. 03)

(iii) අ) ♦ ක්‍රි.ව. 1871 සිට 1946 දක්වා ජන සංඛ්‍යාව සෙමින් වර්ධනය වූ අවධිය.
♦ 1946 පසු ජන සංඛ්‍යාව වේගයෙන් වර්ධනය වූ අවධිය. (ල. 02)

ආ) ♦ උපත් අනුපාතය හා මරණ අනුපාතය අතර වෙනස ♦ අධ්‍යාපන වර්ධනය පහළ බැසීම.
♦ දිවයිනෙන් පිටතට සිදුවන සංක්‍රමණ (ල. 03)

(07) (i) පැරණි මිනුම් - ♦ මූර්ත දළ ජාතික නිෂ්පාදනය ♦ ප්‍රතිශීර්ෂ දළ ජාතික නිෂ්පාදනය ♦ දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධන වේගය

නූතන මිනුම් - භෞතික ජීවන තත්ත්ව දර්ශනය ♦ මානුෂ සංවර්ධන දර්ශකය ♦ මානුෂ දරිද්‍රතා දර්ශකය ♦ මානුෂ පීඩන දර්ශකය (ල. 02)

(ii) ♦ ජනසවිය ♦ සමෘද්ධි ♦ දිවිනැගුම ♦ ප්‍රජා මූල සෞඛ්‍ය වැඩසටහන් නිවාස සංවර්ධන ව්‍යාපෘති.
♦ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි සංවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ♦ සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි ප්‍රගතිය සඳහා ගත් ක්‍රියාමාර්ග (ල. 03)

(iii) අ) ♦ රටේ නව ප්‍රදේශ සංවර්ධනය විවෘත වේ. ♦ වෙළඳ පොළ පුළුල් වීම. ♦ නව නිෂ්පාදන කඩිනමින් වෙළඳපලට පැමිණීම. ♦ භෞතික දුර අඩුවීම. කාලය ඉතිරි වීම. ♦ අභ්‍යන්තර සංක්‍රමණ රාටා වෙනස් වේ. ♦ නව රැකියා අවස්ථා උදා වේ. (ල. 02)

ආ) ♦ රටක අභ්‍යන්තර හා බාහිර සම්බන්ධතා වර්ධනය වේ. ♦ අධ්‍යාපනය සඳහා නව මංපෙත් හෙළිවීම. ♦ සාමාන්‍ය ජනතාවගේ දැනුම පුළුල් වීම. ♦ සේවා අවශ්‍යතා සපුරා ගැනීමේ අවස්ථාව පුළුල් වීම. ♦ විද්‍යුත් මූල්‍ය සේවාවන් මගින් ගනුදෙනු ඉක්මන් වීම හා සුරක්ෂිත වීම වැනි වාසි දෙකක් දක්වා එකක් විස්තර කිරීමට (ල. 03)

(08)

(i) B - කළුගඟ C - ගිංගඟ (ල. 02)

(ii) a) ♦ අධික වර්ෂාපතනය ♦ ගංගා ජලාශ වැව් පිටාර ගැලීම. ♦ වෘක්ෂලතා වැස්මේ ස්වභාවය
♦ අපධාවයේ (මතුපිට ගලා යාම) ප්‍රමාණය හා වේගවත් වීම.

b) ♦ ජල මාර්ග අවහිර කිරීම. ♦ ගංගා මෝය අවහිර කිරීම. ♦ තෙත් බිම් පහත් බිම් ගොඩ කිරීම.
♦ ඉහළ ප්‍රදේශවල වෘක්ෂලතා වැස්ම ඉවත් කිරීම. ♦ පහත් බිම්වල ජනාවාස ඇති කිරීම. (ල. 03)

(iii) අ) A - ප්‍රතිචාර දැක්වීම B - අවම කිරීම. (ල. 02)

ආ) A ♦ ආපදාවට ගොදුරු වූ ප්‍රජාවගේ ආරක්ෂාව සහතික කිරීම. ♦ වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම.
♦ භෞතික දේපල හැකි පමණ ආරක්ෂා කිරීම. ♦ තාවකාලික නිවාස ලබා දීම. ♦ ආහාරපාන සපයා දීම ආදිය කරුණු දෙකක් පැහැදිලි කිරීමට (ල. 03)